චාවකච්චේරි ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට චාවකච්චේරි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් වර්ග 15 ක ඉඩම් හා ගොඩනැගිලි 58 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දේපළ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ආදායමට බැරකළ යුතු රු.726,061 ක්වූ එකතු කළ අගය මත බදු විවිධ තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රු.7,750 ක්වූ කඩ කුලී අත්තිකාරම්, එකතුව රු.152,000 ක්වූ හිඟ කඩ කුලිවලට එරෙහිව හිලවුකර තිබූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල හිඟ කඩකුලිය රු.144,250 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
----------------------------------

ලැබිය යුතු ගිණුම්.
-----------------------

(අ) එකතුව රු.33,400 ක්වූ සභාවේ සහතිකයන් දෙදෙනෙකුට ගෙවන ලද සහික දීමනා අත්තිකාරම් පසුගිය වසර 03 සිට වසර 16 තිස්සේ බේරුම්කර නොතිබුණි.

(ආ) එකතුව රු.145,210 ක්වූ මාර්ග තුනක් ඉදිකිරීමේ වැඩ වෙනුවෙන් ග්‍රාම සංවර්ධන සමිතියට ගෙවන ලද අත්තිකාරම් එම වැඩ නිමකර තිබු නමුත් පසුගිය වසර 06 තිස්සේම බේරුම්කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
--------------------------------------
විගණනයට තොරතුරු ඉදිරිපත් නොකිරීම.
-------------------------------------------------
අවශ්‍ය විස්තරාත්මක උපලේඛන සහ තහවුරු කිරීම් ඉදිරිපත් නොකළ බැවින්, එකතුව රු.71,485 ක්වූ හිඟ අත්තිකාරම් විගණනයේදී සතුටුදායක අන්දමින් සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්
--------------------
නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
------------------------------------------------------------------
නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත | | |
| (i) 93 වගන්තිය | | සියලු ගෘහස්ථ කුණු කසළ ඉවත් කිරීම සහ සියලු වැසිකිළි අසූචි වලවල් ඉවත් කළයුතු කාලය තුළ ඉවත් කොට පිරිපහදු කිරීමට අදාළ කටයුතු සභාව විසින් සිදුකර නොතිබුණි. |
| (ii) 126(vii)(එස්) | | අවහිර කිරීම් සහ අනෙකුත් තාවකාලික වැසිකිළි පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් නිකුත් කළ අවසරපත් සඳහා ගාස්තු අයකිරීම්වලට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි | 521,716 | ඇප තැන්පතු ටෙන්ඩර් තැන්පතු සහ කොන්ත්‍රාත් ඇප තැන්පතු සම්බන්ධයෙන් වසර දෙකක් තිස්සේ අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ<br>2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 | | සභාවට අයත් වාහනවල ඉන්ධන දහන පරීක්ෂණ වසරක් පුරාම සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 55, 767,504 ක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්ත වියදම ඉක්මවූ ආදායම රු.44,710,142 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 105,000 | - | 86,145 | 611,440 | 106,000 | - | 119,728 | 611,440 |
| (ii) කුලී | 14,930 | - | 14,385,089 | 165,204 | 14,930,100 | - | 11,768,598 | 164,779 |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,401,650 | - | 983,870 | 5,850 | 1,401,650 | - | 1,518,317 | 5,850 |
| (iv)වෙනත් ආදායම් | 19,102,820 | - | 38,266,309 | 6,448 | 19,102,620 | - | 37,669,643 | 16,478 |
| එකතුව | 20,625,400 | - | 53,721,413 | 788,939 | 35,540,570 | - | 51,076,586 | 748,547 |

(ආ) වරිපනම් හා බදු අයකිරීමේදී සභාව විසින් උපලේඛන නිකුත් කර නොමැති බව සහ ඇස්තමේන්තුගත ආදායම සහ රැස්කළ ආදායම අතර වෙනස මත සමුච්චිත හිඟ මුදල පදනම්ව ඇති බැව් නිරීක්ෂණය විය.

#### 2.2.2 වරිපනම් සහ බදු

-------------------

එකතුව රු.554,354 ක්වූ හිඟ වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා පසුගිය වසර 01 සිට වසර 30 ක්වූ කාලය තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 2.2.3 කුලී මුදල්

---------------

එකතුව රු.26,254 ක් වූ කඩකුලී අයකර ගැනීම සඳහා පසුගිය වසර 12 කාලය තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

--------------------

එකතුව රු.5,850 ක්වූ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.5 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

------------------------------

2017 දෙසැම්බර් 31 දිනට රු.8,082,550 ක්වූ උසාවි දඩ මුදල් සහ රු.36,580,526 ක්වූ මුද්දර ගාස්තු දිගින් දිගටම උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය, මහජන උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලුම කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් හා සුහසාධන සහ ආරක්‍ෂා කිරීම පිළිබඳව හෙළිවූ කරුණු පහත සඳහන් පරිදි විය.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

i. දෛනිකව රැස් කෙරෙන කසළ කැබලි කර, පස්දමා වසා නොතිබුණි.
ii. මදුරුවන් හා කීටයන් පැතිරීම වැළැක්වීම සහ දුර්ගන්ධය වැළැක්වීම සඳහා මදුරුතෙල් ඉසීමට කටයුතු කර නොතිබුණි.
iii.

3.2 කළමනාකරණ අකාර්යක්‍ෂමතා

----------------------------------

ප්‍රජා මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් රු.97,936 ක පරිත්‍යාගයක් ප්‍රදානය කර තිබුණි. කෙසේවුවත්, එකී පරිත්‍යාගය අපේක්‍ෂිත කටයුත්තට භාවිතා කිරීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

(අ) සභාව මානව සම්පත් විධිමත් පරිදි බඳවා ගැනීම සහ යෙදවීම සිදුකර නොතිබූ බැව් විගණනයේදී නිරීක්‍ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව සම්පත් 16 විසින් නිමකළ යුතු කාර්යයන් ප්‍රමාද වී තිබුණි.

(ආ) සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් ලැබිය යුතු රු.8,319 ක්වූ හිඟ කාර්ය මණ්ඩල ණය අයකර ගැනීම සඳහා පසුගිය වසර පහ තිස්සේම සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

-------------------------------

3.4.1 වාර්ෂික සමීක්ෂණ මණ්ඩල

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ සඳහන් අලුත්වැඩියා කළ හැකි අයිතම 25 ක් සම්බන්ධයෙන් මේ දක්වාම සභාව අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4.2 වත්කම් භාරදීමට අසමත්වීම

-------------------------------

සභාව විසින් භාවිතා කරන තෙවර්ගයක වාහන සභාවට අයත්ව නොතිබුණි.

3.4.3 අක්‍රිය වත්කම්

---------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ට්‍රැක්ටරයක් භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතිණි. එසේවුවත් පසුගිය වසර පහක් පුරාම එය භාවිතයට ගතහැකි තත්ත්වයකට පත් කිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) රුපියල් මිලියන 4.4 ක පිරිවැයකින් එළුතුමාඩ්ඩුවාල්හි ඉදිකරන ලද පොදු වෙළඳ පොළක් සහ රුපියල් මිලියන 1.2 ක පිරිවැයකින් නාවට්ටිකුලිහි ඉදිකරන ලද පොදු වෙළඳ පොළක්, ඒවා මෙහෙයවීමකින් තොරව පසුගිය වසර 02 සිට වසර 04 ක කාලයක් තුළ අක්‍රියව පැවතුණි.

3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

(අ) සභාව විසින් සුසාන භූමි 23 ක දේහ ආදාහනය කිරීම සඳහා අවසරපත් නිකුත් කිරීමට සහ සුසාන භූමි බදු අයකිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභාවේ උප කාර්යාල හතරක උප කොට්ඨාශවල දේපළ යළි ඇගයීම් සිදුකර වරිපනම් හා බදු අයකිරීම සඳහා පසුගිය වසර 10 පුරාම සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4. වගකීම් භාරය සහ යහපාලනය

-------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර රු.19,855 සිට රු.19,453,363 ක හෙවත් සියයට 19 සිට සියයට 125 ක සහ අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.4,449 සිට රු.11,139,551 ක හෙවත් සියයට 06 සිට සියයට 23 දක්වා වූ පරාසවල විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති | අඩුපාඩු |
| --- | --- |
| ----------- | ----------- |
| ගිණුම්කරණය | පාඩු ලේඛනය, ඉඩම් විකුණුම මත බදු ලේඛනය සහ වාහන ලේඛනය නඩත්තු කිරීමට අසමත්වීම. |